සරසවිය
නිදහස් අදහස් මත ගැටෙන අවකාශය
දිවයින
සංස්කරණය
වසන්ත ලියනගේ

වැඩිහිටි තරග විභාග ආකෘතියේ ශිෂ්‍යත්ව පළමු ප්‍රශ්න පත්‍රයක්

2022 දෙසැම්බර් මස 18 වන දින ශිෂ්‍යත්ව විභාගය දිවයින පුරා දෙමව්පියන්ගේ හා ගුරුවරුන්ගේ දැඩි උනන්දුව මධ්‍යයේ පවත්වන ලදී. මෙම විභාගය බොහෝ දරුවන් හට තමන්ගේ විභාගයක් නොව තමන් වෙත දෙමව්පියන් හා ගුරුවරුන් විසින් බලෙන් පැටවූ විභාගයක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි. මෙවර ශිෂ්‍යත්ව විභාගයේදී දරුවන් වෙත ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර දෙකෙන් 1 ප්‍රශ්න පත්‍රය දුටු මා හට ඇති වූ වික්ෂිප්ත භාවය මෙම ලිපිය ලිවීමට මා පෙළඹවූ ප්‍රධාන කාරණාවයි. එබැවින් මෙම ලිපිය අධ්‍යාපන බලධාරීන් සහ සුවහසක් දෙමව්පියන්ගේ අවධානය පිණිස වේ. ශිෂ්‍යත්ව විභාගයට පෙර දින කිහිපයේදීම ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි ජනමාධ්‍ය තුළින් විභාග කොමසාරිස්තුමා දෙමව්පියන් වෙත සඳහන් කළේ සිය දරුවන් අනවශ්‍ය පීඩනයකට ලක්නොකරන ලෙසය. දෙමව්පියන් විසින් ලබාදෙන පීඩනය කෙසේ වෙතත් ශිෂ්‍යත්ව 1 ප්‍රශ්න පත්‍රය තුළින් දරුවන් වෙත ලබාදී තිබූ පීඩනය අතිමහත්ය. එය විභාග කොමසාරිස්තුමන් විසින් පවසන ලද, දරුවන් වෙත පීඩනය අවම කිරීමේ මතයට සම්පූර්ණයෙන්ම පටහැනි වීම පුදුම සහගතය. ශිෂ්‍යත්ව 2 පත්‍රය සකසා ඇති ආකාරය ඉතා ප්‍රශංසනීය වන අතර එම ප්‍රශ්න පත්‍රය විෂය නිර්දේශයට අදාළව සරල තර්කනයන් තුළින් පිළිතුරු ලිවීමට හැකි ආකාරයට සකස්කර තිබීම ඇගයිය යුතුය.

නමුත් ශිෂ්‍යත්ව 1 ප්‍රශ්න පත්‍රය දරුවන් පීඩනයට ලක්කරන ආකාරයට සකස් කර තිබූ ප්‍රශ්න පත්‍රයක් වන අතර එය 5 වසර දරුවකුගේ මනසට නොගැළපෙන ආකාරයට සැකසූවකි. ශිෂ්‍යත්වය යනු කඩයිම් විභාගයක් වන අතර එය රැකියාවකට තෝරාගැනීම සඳහා වන තරග විභාගයක ආකෘතියට ගෙන ඒම කිසිසේත් අනුමත කළ නොහැකිය. පැයක කාලයක් තුළ කුඩා දරුවන් විසින් ප්‍රශ්න 40 කට පිළිතුරු සැපයිය යුතු අතර එක් ප්‍රශ්නයක් සඳහා වෙන්වී ඇති කාලය විනාඩි 1යි තත්පර 30 කි. නමුත් ඉහත ප්‍රශ්න පත්‍රය අදාළ කාලසීමාව තුළදී වැඩිහිටියෙකුට පවා නිවැරදිව පිළිතුරු සැපයිය නොහැකි ප්‍රශ්න පත්‍රයකි. අධ්‍යාපන බලධාරීන් විසින් කුඩා දරුවන් සඳහා උපකාරක පන්ති අනවශ්‍ය බව පුනපුනා පැවසුවද විෂය නිර්දේශයට පරිබාහිරව සකස්කර ඇති මෙම ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයීම විෂය නිර්දේශය යටතේ පාසලින් පමණක් අධ්‍යාපනය හැදෑරූ දරුවෙකුට සිහිනයක්ම පමණක් වනු ඇත. ශිෂ්‍යත්ව ලබාදීම සඳහා සීමිත දරුවන් පිරිසක් තෝරාගැනීමට අවශ්‍ය නම් කළ යුතු වන්නේ විභාගය අපහසු කොට කුඩා ළමුන් වෙත අනවශ්‍ය පීඩනයක් ඇති කිරීම නොව කඩයිම් ලකුණු ඉහළ දැමීම බව මතක් කරනු කැමැත්තෙමි.

මේ ආකාරයට පිළිතුරු තුනක් පමණක් ඇති බහුවරණ ප්‍රශ්න පත්‍රය අපහසු කිරීම තර්කානුකූල දක්ෂ

දරුවන් සඳහා දැඩි බලපෑමක් එල්ල කරනු ඇත. දක්ෂ දරුවන් අපහසු ප්‍රශ්න සඳහා කෙසේ හෝ පිළිතුරු සෙවීමට යෑම නිසා වේලාව ප්‍රමාණවත් නොවන අතර අනෙක් දරුවන් කිසිවක් නොසිතා පිළිතුරු සටහන් කළද එය නිවැරදි වීමට ඇති සම්භාවිතාව 33% ක් වීම ඊට හේතුවයි. ප්‍රශ්න පත්‍ර අපහසු කිරීමට අවශ්‍ය නම් එය කළ යුතු වන්නේ ප්‍රශ්න පත්‍ර දෙක පුරාම සමානව බෙදීයන ආකාරයෙන් මිස එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් ඉලක්ක කර ගනිමින් නොවන බව ප්‍රශ්න පත්‍රය සකස් කළ අයට අවබෝධ නොවීම පුදුම සහගතය. ඉහත ප්‍රශ්න පත්‍රය පැයක කාලසීමාවක් තුළ පිළිතුරු සැපයීමට නොහැකි කුඩා දරුවන්ට නොගැළපෙන ප්‍රශ්න පත්‍රයක් බව පැවසීම තර්කානුකූල නොවන බැවින් මා විසින් ඉතා කුඩා නියැදි පරීක්ෂාවක් කරන ලදී. මේ සඳහා ගණිතය විෂය ධාරාව යටතේ උපාධි හදාරන සිසුන් දසදෙනෙකු තෝරාගත් අතර ඔවුන් වෙත ඉහත ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 7, 22, 35, 36 හා 37 යන ප්‍රශ්න විනාඩි 7යි තත්පර 30ක් තුළ පිළිතුරු සැපයීමට ලබාදෙන ලදී. ලද ප්‍රතිඵලය පුදුම සහගතය. එකදු උපාධි අපේක්ෂක සිසුවෙකුවත් අදාළ කාලය තුළ සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු ලබානොදුන් අතර ප්‍රශ්න 3 කට වඩා පිළිතුරු ලබාදුන් සිසුන් සිටියේද දෙදෙනකු පමණි. මෙයින් ගම්‍ය වන්නේ කුමක්ද? ගණිත උපාධි අපේක්ෂක සිසුන්ටවත් අදාළ කාලය තුළ පිළිතුරු සැපයීමට නොහැකි ප්‍රශ්න කුඩා දරුවන්ට දී ඇති බවයි. මෙම ප්‍රශ්න පත්‍රය සකස්කර ඇත්තේ ප්‍රශ්න පත්‍රය සකස් කළ අයගේ හැකියාවන් පෙන්වීමට මිස ළමුන්ගේ හැකියාව පෙන්වීමට නොවන බව පැහැදිලිය.

ප්‍රශ්න අංක 7 ට අදාළ රූපයේ ඇති වෘත්ත ගණන අසා ඇති අතර මෙම ප්‍රශ්නය ගැටලු සහගතය. 5 ශ්‍රේණියේ දරුවන් සඳහා ලක්ෂ්‍යය යන ගණිත සංකල්පය හඳුන්වාදී නොමැති පසුබිමක ඉහත ගැටලුවේ වෘත්ත එකිනෙක ඇඳීමේදී මධ්‍ය ලක්ෂයක් වටා සෑම වෘත්තයකම රේඛා ගමන් කිරීම නිසා මධ්‍ය ලක්ෂ්‍යය පාට කළ වෘත්තයක් ලෙස දිස්වී තිබේ. මෙහිදී දක්ෂ දරුවන් වෘත්ත සංඛ්‍යාව 8 හා 9 යන පිළිතුරු අතර දෝලනය වනු ඇත. සලකුණු කිරීමට ලබාදී තිබූ පිළිතුරු අතර 8 හා 9 යන පිළිතුරු දෙකම අන්තර්ගත කර නොතිබුණා නම් ගැටලුවකින් තොරව පිළිතුරු සොයාගැනීමට ළමුන්ට හැකි වුවද එසේ නොකොට අදාළ පිළිතුරු දෙකම පිළිතුරු සඳහා ගෙන ඒමෙන් දරුවන් අනවශ්‍ය පීඩනයකට ලක්කර ඇත. එලෙසම එක් ප්‍රශ්නයක් සඳහා නිවැරදි පිළිතුරු දෙකක් තිබීම වැරදි සහගතය. ප්‍රශ්න අංක 22 හිතාමතාම අපහසු කර ඇති අතර වැඩිහිටි තරග විභාග සඳහා නිතර ලබාදෙන ප්‍රශ්නයකි. එය කුඩා දරුවන්ගේ මනසට බර වැඩිය. ප්‍රශ්න අංක 37 බොහෝ සංඛ්‍යාන ආශ්‍රිත උපාධි පාඨමාලාවල පළමු හා දෙවන වසර තුළ උගන්වන සංකරණ හා සංයෝජන ආශ්‍රයෙන් යොමුකර ඇති අතර 5 වසර දරුවෙකු සඳහා යොදාගැනීමේ යෝග්‍යතාවය ගැටලු සහගතය. අවසාන වශයෙන් ප්‍රශ්න අංක 35, 36, හා 38 යන ප්‍රශ්න කුඩා දරුවන්ගේ මනසට නොගැළපෙන ආකාරයේ විනාඩි එකයි තත්පර තිහක් තුළ පිළිතුරු සැපයිය නොහැකි ප්‍රශ්න බව මාගේ හැඟීමයි.

මෙවැනි ප්‍රශ්න පත්‍ර ලබාදීම තුළින් කුඩා දරුවන් තුළ අධ්‍යාපනය ගැන කලකිරීමක් ඇති වන අතර දැඩි මානසික පීඩනයකට හා ආතතියකට පත්වීම ඛේදවාචකයකි. පාසල තුළින් පමණක් ඉගෙන ගන්නා දරුවන්ගේ පාසල් කෙරෙහි ඇති විශ්වාසය බිඳ වැටෙන අතර උපකාරක පන්ති යන දරුවන් තව තවත් ඒවා කෙරේ යොමු වීම සිදුවනු ඇත. දැන් සිදුවිය යුත්ත සිදුවී හමාරය. දැන් කළ යුතුව ඇත්තේ ශිෂ්‍යත්ව කඩයිම් ලකුණු පහළ දමමින් ළමයින්ට යම් සාධාරණයක් ඉටුකළ යුතු බව අධ්‍යාපන බලධාරීන් මතක තබාගත යුතුය. ඉදිරියේදී මෙවැනි සංකීර්ණ, කුඩා දරුවන්ගේ මනසට නොගැළපෙන ප්‍රශ්න ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රය සඳහා ඇතුළු නොකළ යුතු අතර එම ප්‍රශ්න පත්‍රය රැකියා සඳහා තෝරා ගැනීමට ඉදිරිපත් කරන ප්‍රශ්න පත්‍රයක ආකෘතියට ගෙන ඒම වැළැක්විය යුතුව ඇත.

ආචාර්ය
එන්. එම්. කරන්නාගොඩ
කොළඹ විශ්වවිද්‍යාලය.

නිදහස් සුව පිරි නව වසරක් වේවා

විඩා බර වූ වතින් දා බිඳු තෙමුණු ගත හරි බරයිනේ
කැළඹි කැළඹී නටන සිතුවිලි තෙරපි තෙරපී හිඳියිනේ
දිවුනු දිවයන පුරුදු නවතියි නිදහසේ සැප ළඟ අනේ
සොඳුරුතම වූ දහන නිදහස ළබැඳි සුව දෙයි සුබ දිනේ

හැඟුම් පමණක් පිරී ඉතිරෙන
නිවුණු සිතුවිලි සනා සැනහෙන
දුහුල් රොදකින් පැතුම් රන්දන
මෙවන් සැනසුම් ලොවෙහි කොයිබද

පිනකි නිදහස් සැපය ලැබුමම
සොබාදම නිති රුකුල වනු ඇත
සතන් පරයා යන්නෙ කුමටද
නිදහසයි මනු සතුගෙ වත්කම

සිතුවිලි දොරේ ගලනා අත්දම්
සැහැල්ලු මන පින සුව දෙන පින්කම්
රජයන ලෙන්ගතු සුන්දර මනුදම්
මිනිසෙකු කුමටද නිදහස නැතිනම්

ඩී. එල්. අයි. එස්. රන්චාමර
පිළියන්දල

2021 උසස් පෙළ සමත් සිසුන් සඳහා රජයේ පොලී රහිත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්න කඩිනම් පියවර ගන්න

අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට සුදුසුකම් සහිතව සමත්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලයක් සඳහා ඇතුළත් වීමට අවස්ථාව උදාවන්නේ සිසුන් 43,000 ක් පමණ ඉතා සුළු පිරිසකටය. මෙයට පිළියම් වශයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉඩකඩ සීමිත නිසා ඉතිරි සමත් සිසුන්ගෙන් සැලකිය යුතු පිරිසකට රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලයකට ඇතුළත්ව තම උසස් අධ්‍යාපනය සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේදී ආරම්භ කර අඛණ්ඩව වසර 06 ක් පුරාවට ක්‍රියාත්මක කරන ලද රජයේ ණය යෝජනා ක්‍රමය සඳහා පසුගිය සෑම වසරකම පාහේ දෙසැම්බර් 20 වැනිදා අයදුම්පත් කැඳවන ලදී. එහෙත් ඉතා කනගාටුදායක අන්දමට මෙම වසරේදී 2021 උසස් පෙළ සමතුන් සඳහා අයදුම්පත් කැඳවීම නතර කර දමා ඇත.

රට තුළ පවතින ආර්ථික අර්බුදය පිළිබඳව අපටද මනා අවබෝධයක් පවතී. එනමුත් දහටමත් දස දහස් ගණනක් වූ පුතුන්ගේ උසස් අධ්‍යාපන සිහිනය සැබෑ කිරීමට උපකාරී වූ මෙම වටිනා ණය යෝජනා ක්‍රමය රටේ අනාගත සංවර්ධනය වෙනුවෙන් බුද්ධිමත් තරුණ පිරිසක් බිහිකිරීමට දක්වන දායකත්වය අතිමහත්ය. අභියෝග මධ්‍යයේ වුවද මෙම වැඩසටහන නවතා දැමීමකින් තොරව අඛණ්ඩව අප සඳහා ක්‍රියාත්මක කිරීම උදෙසා කඩිනම් පියවර ගන්නා ලෙස ජනාධිපතිතුමා, අධ්‍යාපන ඇමැතිතුමන් සහ අදාළ බලධාරීන්ගේ අවධානයට යොමුකර දෙනමෙන් ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිමු.

2021 ශිෂ්‍ය ණය අපේක්ෂිත සිසුන්.

ජර්මන් යුවළගෙන් රටටම ආදර්ශයක්

විවාහ මංගල උත්සවය නවතා ඒම මුදලින් දුප්පත් පවුල් 1000කට ආහාර මලු දීලා

මිනුවන්ගොඩ / රෝනි කරුණානායක

ජර්මනියේ දී විවාහ වී ලංකාවේ දී විවාහ මංගල උත්සවය ගැනීමට පැමිණ එම විවාහ මංගල උත්සවය නැවතා ඊට වියදම් කිරීමට නියමිතව තිබූ මුදල් වලින් තෝරා ගත් පවුල් 1000 කට වියළි ආහාර පාර්සල් සහ දිවා ආහාර පාර්සලයක් ලබා දීමට මිනුවන්ගොඩ, මාතම්මන ඔතෝපෙඩික් (කෘතිම අත් පා නිෂ්පාදන) ආයතනයේ ස්ටේපාන් වෙන්ඩ්ලන්ඩ් සහ ජූලියා වෙන්ඩ්ලන්ඩ් යුවළ පසුගියදා (31) කටයුතු කළේය.

ස්ටේපාන් වෙන්ඩ්ලන්ඩ් මහතාගේ

දෙමාපියන් වන ඩීටර් වෙන්ඩ්ලන්ඩ් සහ රත්නසීලි වෙන්ඩ්ලන්ඩ් යුවළ ද පසුගිය වසර 20 ක් පුරා අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි ආහාර පාර්සල් බෙදාදීම සිදු කර තිබේ.

ස්ටේපාන් සහ ජූලියා යුවළ ආහාර පාර්සල් බෙදාදීම සිදු කළ අයුරු

A පොසිටිව් වකුගඩුවක් ලබාදී ජීවිතයක් රැකගනිමු

දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන

අධාර්මිකව සේවකයින්ගේ ශ්‍රමය සූරා කෑවේ නැහැ

තමා හරිහම්බ කරගත් ධනය රටේ ජනතාව වෙනුවෙන් වැය කළා

ශ්‍රීමත් සිරිල් ද සොයිසා මෑත කාලයේ ශ්‍රී ලංකාවෙන් බිහි වූ ශ්‍රේෂ්ඨතම පුද්ගලයෙක්

රාජකීය පණ්ඩිත බළපිටියේ සිරි සීවලී නාහිමියෝ

බළපිටිය - අනුර යසමිත්

අද දේශපාලනයේ තමන්ගේ පෞද්ගලික ධනය වැය කරල සමාජ සේවාවක් කරන අය ඇත්තේ නැහැ. ඒ අය මහජන මුදලින් වැඩ කරල තමන්ගේ ධනයෙන් කළා වගේ ලොකුවට නමත් ගහගෙන එයිනුත් කොමිස් ගහ ගන්නවා යැයි අමරපුර මහා සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී දර්ශනපති, රාජකීය පණ්ඩිත බළපිටියේ සිරි සීවලී නාහිමියෝ පැවසූහ.

කළුතර බෝධි භාරකාර මණ්ඩලයේ නිර්මාතෘ හා හිටපු සෙනෙට් සභාවේ සභාපති ශ්‍රීමත් සිරිල් ද සොයිසා මහතාගේ 45 වැනි ගුණසමරුව නිමිත්තෙන් ඊයේ (02දා) පෙරවරුවේ දී බළපිටිය ප්‍රාදේශීය සභාව ඉදිරිපිට පැවති ගුණසමරු උත්සවයකදී අනුශාසනාවක් පවත්වමින් නාහිමියෝ එසේ කීහ.

තවදුරටත් කතා කළ සීවලී නාහිමියෝ මෙසේ ද කීහ.

මෑත ඉතිහාසයේ ලංකාවේ රජ දරුවෙකුගෙන් පස්සෙ අපේ මාතෘ භූමියේ පූජනීයම ස්ථානයක් වන කළුතර බෝධිය හා චෛත්‍යය ශ්‍රීමත් සිරිල් ද සොයිසා මහතා නිර්මාණය කරමින් අපට පමණක් නොව ජාත්‍යන්තරයටම වන්දනාමාන කරන්න සලසා දුන්නා. රජ කාලයෙන් පස්සේ මෙතුමාට හැරෙන්න වෙනත් කෙනෙකුට ඒ වගේ ප්‍රතාපවත් පූජනීය ස්ථානයක් කරන්න බැරිවුණා. එතුමා නීති වෘත්තියෙන් හා විවිධ ව්‍යාපාරවලින් හරි හම්බ කරගත් ධනය වැය කරමින් මතු පරපුර වෙනුවෙන් මේවා නිර්මාණය කළේ.

බළපිටියෙන් බිහිවූ වීරවරයන් වසරකට වරක්වත් සැමරීම අගය කරනවා. බළපිටියේ විරුවන් පිට ගිහිල්ලයි සේවාව කළේ. සී. පී. ද සිල්වා මැතිතුමා බළපිටියේ උපන්නට සේවය කළේ පොළොන්නරුවට. සියලු දෙනා හිතාගෙන ඉන්නේ එතුමා ඒ ප්‍රදේශයේ උපන් කෙනෙක් හැටියටයි. නිදහස් අධ්‍යාපනයේ පියා වන ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා බළපිටියේ උපන්නට මතුගම කියලයි කියන්නේ.

බණ්ඩාරනායක මහතාගේ රජයෙන් බස් ජනසතු කරන විට බොහෝ බස් හිමියෝ හඬා වැටුණා. බස්රථවල ටයර් ගැලෙව්වා. ශීට් විතරක් නොව බොහෝ කොටස් ගලවා ගත්තා.

නමුත් සිරිල් ද සොයිසා මහතා බස් රථවල පරණ ටයර් ඉවත් කර අලුත් ටයර්, ගෙවුණු කොටස් වෙනුවට අලුත් කොටස් දමල සෝදා පිරිසිදු කරල ටැංකි පිරෙන්න ඉන්ධන පුරවලයි රජයට දුන්නේ. මෑත කාලයේ ලංකාවෙන් බිහි වූ ශ්‍රේෂ්ඨ චරිතයක් හැටියට හඳුන්වන්න පුළුවන්.

බළපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති සමන් ද සිල්වා, විපක්ෂ නායක අජිත් අසේල ද සොයිසා, රන්ජන් ද සිල්වා, කළුතර බෝධි භාරකාර මණ්ඩලයේ කළමනාකරු වසන්ත ද සිල්වා බළපිටිය සිරිල් ද සොයිසා ගුණ සමරු කමිටුවේ කැඳවුම්කරු විශ්‍රාමලත් පරිපාලන ග්‍රාම නිලධාරි නිමල් ඒ. ද ඇස්. කනකරත්න, බළපිටිය තරුණ බෞද්ධ සංගමයේ සභාපති නීතිඥ එල්සන් කුමාරවඩු මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.

ශ්‍රී ලංකාවේ ප්‍රථම බාලදක්ෂ පාසලේ ආදර්ශ ජීව වායු පද්ධතිය විවෘත කරයි

පුත්තලම / නලින් හෙන්දුරුගොඩ

ශ්‍රී ලංකාවේ ප්‍රථම බාලදක්ෂ පාසල වූ ආචාර්ය රාජගුරු බාලදක්ෂ පාසලේ ඉදිකරනු ලැබූ ආදර්ශ ජීව වායු පද්ධතිය විවෘත කිරීම 01 දා සවස සිදු කළේය.

හලාවත - වාලහේන පිහිටි මෙම බාලදක්ෂ පාසල තුළ ජීව වායු පරිහරණය කොට ආහාර පිසීම, මෙහි රෝපණය කර ඇති සියලු පලතුරු හා එළවළු පැළ සඳහා ජීව වායු ඇසුරෙන් නිෂ්පාදනය වන දියර පොහොර භාවිතා කොට ආදර්ශමත් ගොවිපොළක් නිර්මාණය කිරීම, බාලදක්ෂ දරුවන් හට දියර පොහොර භාවිතය පිළිබඳව දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ ගෙවතු වගාවන් පෝෂණය කිරීමට සවියක් වීම මූලික අරමුණ කරගෙන මෙම ආදර්ශනය ඉදිකළ බව බාලදක්ෂ පාසලේ නිර්මාතෘ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ මූලස්ථානයේ දිසා කොමසාරිස් ආචාර්ය චම්පික ලෝ මහතා පැවසීය.

රුපියල් ලක්ෂ 9 පමණ මුදලක් වැය කර ඉදිකළ මෙම ආදර්ශ ජීව වායු පද්ධතිය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දුන් කුවේට් රාජ්‍යයේ නිකරගුවා තානාපති කාර්යාලයේ මහජන සම්බන්ධතා නිලධාරී දේශමාන්‍ය ආචාර්ය සුරේෂ් ඩිලාන් මහතා අතින් මෙම ආදර්ශ ජීව වායු පද්ධතිය විවෘත කිරීම සිදු කළේය.

මෙම අවස්ථාවට පුත්තලම දිසා ශාසනාරක්ෂක බලමණ්ඩලයේ සභාපති පරිවේනාධිපති හාල්පන්විල පාලිත හිමිපාණන්, විද්‍යාලයේ විදුහල්පතිනි චමෝදිකා ලෝව්, උප විදුහල්පතිනි ජයසිංහ රාජගුරු ඇතුළු පිරිසක් ද සහභාගි වූහ.

පිස්සු බල්ලෙකු හදා ගත්තැයි ප්‍රංශ ජාතිකයෙක් අත්අඩංගුවට

ආර්. ඒ. එස්. ප්‍රේමතිලක-බණ්ඩාරගම

පිස්සු රෝගය වැළඳී සිටි සුනඛයකු ඇති දැඩි කිරීම සම්බන්ධයෙන් ප්‍රංශ ජාතිකයෙකු ඊයේ (2 දා) දහවල් අත්අඩංගුවට ගත් බව අලුත්ගම පොලිසිය පවසයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ බෙන්තොට, අංගාගොඩ, ස්වර්ණපාය ලිපිනයේ පදිංචි එරික් මාර්ෂල් බර්නාඩ් නමැති 84 හැවිරිදි පුද්ගලයකු බව පොලිසිය කීය.

සැකකරු විසින් ගෙඩිඑෙන් සුනඛ වර්ගයට අයත් අවුරුදු 7 ක් පමණ වයසැති ලකී නමැති බැල්ලියක සුරතලයට ඇති දැඩි කර ඇති අතර, බැල්ලිය ඉකුත් 23 දා පුද්ගලයන් පස් දෙනකු සහ සුනඛයන් තිදෙනකු සපා කා තිබුණි.

එම බැල්ලිය ඉකුත් 26 දා හදිසියේ මියගොස් ඇති අතර, සුනඛ හිස බොරැල්ල පරීක්ෂණ ආයතනයට යොමු කිරීමෙන් පසු කළ පරීක්ෂණවලදී සුනඛයාට